# අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

**ඉතිහාසය I** | **පැය එකයි**

සැලකිය යුතුයි :

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 80ක්** හිමි වේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.

**01.** මහාවංසයට ලියන ලද ටීකාව ලෙස සැලකෙනුයේ මින් කවරක් ද?
(1) විනයට්ඨ කථාව (2) වංසත්ථප්පකාසිනි
(3) ජාතකට්ඨ කථාව (4) උත්තර විහාර අට්ඨ කථාව

**02.** සීගිරියේ පොතාන අයත් වන්නේ කවර ප්‍රාග් ඓතිහාසික වාසස්ථානයකට ද?
(1) පහතරට වියළි කලාපීය ලෙන් (2) කඳුරට එළිමහන් දඩයම් ස්ථාන
(3) පහත රට තෙත් කලාපීය ලෙන් (4) වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු

**03.** පහත සඳහන් යුගලයන්ගෙන් එකිනෙක හා සම්බන්ධ **නොවන** යුගලය තෝරන්න.
(1) තමා ''නරඉසෙර'' ලෙස හඳුන්වා ගැනීම - කූටකණ්ණ අභය රජතුමා
(2) ''මින්නේරි දෙවියන්'' ලෙස පූජනීයත්වයට පත් වීම - මහසෙන් රජතුමා
(3) ''ආලකමන්දාධිපති'' යෙදුම භාවිත කිරීම - පළමුවන මුගලන් රජතුමා
(4) ''චක්‍රවර්තී'' සංකල්පය භාවිත කිරීම - නිශ්ශංකමල්ල රජතුමා

**04.** පළමුවන විජයබාහු රජතුමාගේ පාලන සමය වඩාත් වැදගත් වන්නේ පහත සඳහන් කවර කරුණක් නිසා ද?
(1) දේශපාලන සුරක්ෂිතතාව සඳහා අසල්වැසි රාජ්‍යයන් සමග විවාහ සබඳතා පවත්වා ගැනීම
(2) චෝළ පාලකයන්ගෙන් රට මුදවා ගෙන, ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම
(3) රටේ ආර්ථික අභිවෘද්ධිය සඳහා වැදගත් සේවයක් ඉටු කිරීම
(4) වෙහෙර විහාර රාශියක් ප්‍රතිසංස්කරණය කිරීම

**05.** ''අහසෙන් වැටෙන එක් දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යෑමට ඉඩ නොදිය යුතු ය'' යන ප්‍රකාශය කරන ලද්දේ කවර රජතුමා විසින් ද?
(1) වසභ රජතුමා (2) මහසෙන් රජතුමා
(3) ධාතුසේන රජතුමා (4) මහා පරාක්‍රමබාහු රජතුමා

**06.** ''භාෂා හා ආගම් අතින් වෙනස් වුව ද අසල්වාසි රටවල ප්‍රජාව සමග **විශ්වාසවන්ත** ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණයකි''. ඉහත ප්‍රකාශය සනාථ කිරීම සඳහා දිය හැකි උදාහරණයක් වන්නේ,
(1) පළමුවන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගි වීම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට යෑම යි.
(2) හයවන අග්ගබෝධි රජු විසින් චීනය සමඟ රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් ක්‍රියාත්මක කිරීම යි.
(3) පළමුවන විජයබාහු රජතුමා දළදා මාළිගාවේ ආරක්ෂාව වේලයික්කාර හමුදාවට පැවරීම යි.
(4) පළමුවන පරාක්‍රමබාහු රජතුමා පාණ්ඩ්‍ය දේශයට යුධ ආධාර දීම යි.

**07.** දකුණු ඉන්දියානු කුලී භේවායන්ගේ පිහිට පැතූ මුල් ම දේශීය පාලකයන් ලෙස සැලකෙන්නේ,
(1) කූටකණ්ණ තිස්ස හා වෝහාරික තිස්ස රජවරුන් ය.
(2) පළමුවන සිරිනාග හා ඉලනාග රජවරුන් ය.
(3) වෝහාරික තිස්ස හා අභයනාග රජවරුන් ය.
(4) ඉලනාග හා අභයනාග රජවරුන් ය.

**08.** පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවල නියුක්ත වූ ශිල්පීන් A තීරයේ දැක්වෙන අතර, B තීරයේ එම කර්මාන්ත ක්ෂේත්‍ර දැක්වේ. A හා B තීර ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| **"A" තීරුව** | | **"B" තීරුව** | |
|---|---|---|---|
| (i) | කබර | A | නූල් කැටීම |
| (ii) | දටික | B | චිත්‍ර ඇඳීම |
| (iii) | තතවය | C | යකඩ වැඩ |
| (iv) | චිතකර | D | ඇත්දත් කැටයම් |

(1) A D C B (2) B C A D (3) C A D B (4) C D A B

**09.** ''සකපෝරුව'' නමින් හැඳින්වෙන සරල යන්ත්‍රය භාවිත කර ඇත්තේ කුමන අමු ද්‍රව්‍යයක් යොදාගෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ද?

(1) යකඩ (2) මැටි (3) ලී (4) ඇත්දත්

**10.** සුළඟ නිසා ඇතිවන ජල තරංග මගින් වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීම සඳහා ඉදිකර ඇති අංගය මින් කුමක් ද?

(1) සොරොව්ව (2) වැව් බැම්ම (3) රළපනාව (4) බිසෝකොටුව

**11.** පැරණි වාස්තු විද්‍යාඥයන් උස ගොඩනැගිලි අකුණු සැරවලින් බේරා ගැනීම සඳහා භාවිත කළ උපකරණය හඳුන්වා ඇත්තේ,

(1) මොහොළ නමින් ය. (2) දියකැට පහන නමින් ය. (3) වජ්‍ර චුම්බට නමින් ය. (4) එල්ලංගාව නමින් ය.

**12.** අපේ පැරණි වෛද්‍ය විද්‍යාවේ විශිෂ්ටත්වය දැක්වීමට හොඳම උදාහරණය ලැබෙන්නේ,

(1) අනුරාධපුරයේ අභයගිරි කැණීම් වලින් ය.
(2) පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් කැණීම් වලින් ය.
(3) අනුරාධපුර ඇතුළු නුවර කැණීම් වලින් ය.
(4) සීගිරියේ අලකොලවැව දෙහිගඟ ඇළකන්ද කැණීම් වලින් ය.

**13.** ''මාඝාත'' නීතිය පනවන ලද්දේ කුමන රජතුමා විසින් ද?

(1) අමණ්ඩගාමිණී අභය (2) හතරවන මිහිඳු (3) තුන්වන උදය (4) පළමුවන ගජබාහු

**14.** පහත සඳහන් නීති අතරින් පරිසර සංරක්ෂණය හා සම්බන්ධව **වඩාත් ම** වැදගත්වන නීතිය කුමක් ද?

(1) වැව්වලින් ජලය ලබා ගන්නා කුඹුරුවල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතු ය.
(2) ජලාශවල ජීවත් වන පක්ෂීන් නොමැරිය යුතු ය.
(3) මී හරකුන්, එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැමිණ විය යුතු ය.
(4) උස් ගොඩබිම් ඉඩම්වල කැළෑ නොකැපිය යුතු ය.

**15.**
- කෝට්ටේ බලකොටුවක් නිර්මාණය කිරීම
- ආර්ය චක්‍රවර්තී රජුගේ බදු නිලධාරීන්ට දඬුවම් පැමිණ වීම
- රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස රාජ්‍ය කටයුතු කිරීම

ඉහත සඳහන් ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයා වූයේ,

(1) සේනාධිලංකාර සෙනවිරද් ය. (2) නිශ්ශංක අලකේශ්වර ය.
(3) වීර අලකේශ්වර ය. (4) අම්බුලුගල කුමරු ය.

**16.** පහත ''අ''තීරුවේ සඳහන් සාහිත්‍ය කෘති ''ආ'' තීරුවේ ඇති රාජධානි යුගයන්ට අදාළ ව නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| **"අ" තීරුව** | | **"ආ" තීරුව** | |
|---|---|---|---|
| (i) | දළඳා සිරිත | A | පොළොන්නරු |
| (ii) | ගුත්තිල කාව්‍යය | B | දඹදෙණි |
| (iii) | කව් සිළුමිණ | C | කුරුණෑගල |
| (iv) | සද්ධර්මාලංකාරය | D | ගම්පොළ |
| | | E | කෝට්ටේ |

(1) A B D E (2) B E C D (3) C B D E (4) C E B D

**17.** පහත දැක්වෙන තොරතුරු අතරින් පළමු වන විමලධර්මසූරිය රජුට පමණක් අදාළ වන්නේ,

A - කුසුමාසන දේවිය විවාහ කර ගැනීම

B - දන්තුරේ සටනේ දී පෘතුගීසීන් අන්ත පරාජයට පත් කිරීම

C - රන්දෙනිවල සටනට නායකත්වය දීම

D - පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

**18.** පෘතුගීසීන් උඩරට යටත් කර ගැනීම සඳහා කළ සටන්වල දී ''දොන් ජෙරනිමෝ ද අසවේදු'' මෙහෙය වූයේ,

(1) දන්තුරේ සටන යි. (2) බලන සටන යි.

(3) රන්දෙනිවල සටන යි. (4) ගන්නොරුව සටන යි.

**19.** පෘතුගීසීන් හා යාපනය රාජධානිය අතර, ගැටුම් ඇති වීමට බලපෑ ප්‍රධාන ම හේතුව වන්නේ,

(1) සංකිලි රජුගේ පාලන කාලයේ දී පෘතුගීසි වෙළෙඳ නැව්වලට බාධා එල්ල වීම ය.

(2) මන්නාරම අවට ප්‍රදේශවලින් මුතු කිමිදීමෙන් පෘතුගීසීන් ලද ආදායම අහිමි වීම ය.

(3) කුරුඳු, ගම්මිරිස් වැනි වෙළෙඳ ද්‍රව්‍ය, යාපනය ප්‍රදේශයෙන් ලබා ගැනීමේ දී බාධා එල්ල වීම ය.

(4) වීදියබණ්ඩාර යාපනයට පලා ගිය අවස්ථාවේ සංකිලි රජු ඔහු පිළිගැනීම ය.

**20.** මහනුවර රාජධානියේ නීත්‍යානුකූල අයිතිය ඉංග්‍රීසීන් විසින් තහවුරු කර ගනු ලැබුවේ,

(1) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ ආක්‍රමණය මගිනි.

(2) ශ්‍රී වික්‍රමරාජසිංහ රජු අල්ලා ගැනීමෙනි.

(3) 1815 උඩරට ගිවිසුම මගිනි.

(4) 1818 ප්‍රකාශය නිකුත් කිරීම මගිනි.

**21.** කෝල්බෲක් කොමිසම මගින් ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද යෝජනාව කුමක් ද?

(1) දිවයින පළාත් පහකට බෙදීම

(2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

(3) උඩරට හා පහතරට ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම

(4) රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම

**22.** මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ඉදිරිපත් වූ යෝජනා ඇතුළත් පිළිතුර තෝරන්න.

A - ව්‍යවස්ථාදායක සභාවේ ප්‍රථමවරට නිල නොලත් පිරිස බහුතරය වීම

B - උගත් ලාංකිකයන් වෙනුවෙන් නියෝජිතයෙකු ව්‍යවස්ථාදායක සභාවට පත් කිරීම

C - පළාත් බද නියෝජනය හඳුන්වා දීම

D - විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

- **පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරෙන් 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු | ස්වදේශීක නායකයන් |
|---|---|---|
| A 1803 | D ටොරින්ටන් සාමි | G ගොංගාලේගොඩ බණ්ඩා |
| B 1818 | E ෆ්‍රෙඩ්රික් නෝර්ත් | H කැප්පෙටිපොළ |
| C 1848 | F රොබට් බ්‍රවුන්රිග් | J ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |

**23.** මැක්ඩොවල් යටතේ උඩරට ආක්‍රමණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A E J (2) A F G (3) B F H (4) C D J

**24.** බ්‍රිතාන්‍යයන්ගේ පාලනයට විරුද්ධව මෙහෙයවන ලද ප්‍රථම නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A D G (2) B E J (3) B F H (4) C F J

**25.** 1848 නිදහස් සටනට බලපෑ ආසන්න ම හේතුව වූයේ,

(1) 1840 දී පනවන ලද මුඩුබිම් පනත ය.
(2) රජය හා මහජනතාව අතර සබඳතාව දුරස් වීම ය.
(3) රජයේ නව බදු ප්‍රතිපත්තිය ය.
(4) නව අධිකරණ ක්‍රමයක් හඳුන්වා දීම ය.

• **පහත සඳහන් A, B, C, D ලෙස දක්වා ඇති යුගල අධ්‍යයනය කර, 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A`- 1. ලුණු හා කුරුඳු ඒකාධිකාරය අහෝසි කිරීම
2. පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල යෙදීම

B`- 1. කෝපි වගාව
2. හැමීලියා වෙස්ටර්ට්‍රික්ස්

C`- 1. තේ වගාව
2. ලූල්කඳුර වතුයාය

D`- 1. පොල් වගාව
2. ජේම්ස් ටේලර්

**26.** පළමුවැන්න නිසා දෙවැන්නේ වර්ධනය පෙන්වන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**27.** පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධයක් නැති යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**28.** දෙවැන්න, පළමුවැන්නේ විනාශයට හේතු වූ බව පෙන්වන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**29.** පහත සඳහන් සිද්ධීන් කාලානුරූපව පෙළගැස් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A - විධායක ජනාධිපති ධූරය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම
B - සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
C - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වීම
D - එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා ෆෙඩරල් පක්ෂය පිහිටු වීම

(1) A D C B (2) C B D A (3) D B A C (4) D C B A

**30.** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ සඳහන් වන්නේ පහත සඳහන් කුමන කරුණ පිළිබඳව ද?

(1) අගමැති හා අමාත්‍ය මණ්ඩලය
(2) අධිකරණ පද්ධතිය හා යුක්තිය පසිඳලීම
(3) ජාතික රාජ්‍ය සභාව හා නීති සම්පාදනය
(4) මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස

**31.** 1919 වර්ෂයේ දී ලංකා ජාතික සංගමය පිහිටුවීමට සිංහල නායකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ ජන නායකයා

(1) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (2) ආරුමුග නාවලර්තුමා මහතා ය.
(3) ඇම්.සී. සිද්දිලෙබ්බේ මහතා ය. (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.

**32.** මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පොල්ගොල්ල හැරවුමෙන් සුදු ගඟට එකතු වන ජලය, වියළි කලාපීය වැව්වලට බෙදාහැරීම සිදු වන්නේ කුමන ජලාශයට එකතු වීමෙන් පසුව ද?

(1) වික්ටෝරියා (2) කොත්මලේ (3) බෝවතැන්න (4) රන්ටැඹේ

**33.** පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ **වැදගත් ම** වෙනස මින් කවරක් ද?
(1) රජවරු පාලන කටයුතුවල දී මධ්‍යම පංතිය සහාය කර ගැනීම
(2) ජාතිකත්ව සංකල්පය වර්ධනය වීම
(3) සියලු බලතල රජු වටා කේන්ද්‍ර ගත වීම
(4) ප්‍රාදේශීය රාජ්‍ය එක්සේසත් කිරීම

- **යාබද රූපය ඇසුරෙන් 34 හා 35 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



**34.** රූපයෙන් දැක්වෙන ක්‍රියාව අදාළ වන්නේ කාර්මික විප්ලවය හා සම්බන්ධ කුමන කර්මාන්ත ක්ෂේත්‍රයකට ද?
(1) ආකර
(2) කෘෂි
(3) පේෂ
(4) ප්‍රවාහනය

**35.** රූපයේ දැක්වෙන කාර්යය වඩාත් පහසු කර ගැනීම සඳහා නිර්මාණය කරන ලද නව නිපැයුම කුමක් ද?
(1) වාෂ්ප එන්ජිම (2) ආරක්ෂක ලාම්පුව (3) යකඩ කේබල් කම්බි (4) රෝලර් යන්ත්‍රය

**36.** ''අ''තීරුවේ දක්වා ඇති ප්‍රකාශන ''ආ'' තීරුවේ ඓතිහාසික සිද්ධීන් හා නිවැරදි ව ගළපා ඇති පිළිතුර කුමක් ද?

| **''අ'' තීරුව** | | **''ආ'' තීරුව** | |
|---|---|---|---|
| (i) | බොස්ටන් තේ සාදය | A | පළමු වන ලෝක යුද්ධය |
| (ii) | සමාජවාදී දර්ශනය පිළිගත් රටක් බිහිවීම | B | අමෙරිකානු විප්ලවය |
| (iii) | ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් හා ඔහුගේ බිරිඳ ඝාතනය | C | රුසියන් විප්ලවය |
| (iv) | පර්ල් වරායට පහර දීම | D | දෙවන ලෝක යුද්ධය |
| | | E | ප්‍රංශ විප්ලවය |

(1) B C A D (2) B E A D (3) D C A E (4) D E C B

**37.** රුසියානු විප්ලවය සාර්ථක වීමට බලපෑ ප්‍රබල ම සාධකය වූයේ,
(1) රටපුරා උග්‍ර ආහාර හිඟයක් ඇති වීම හා පාන් මිළ ඉහළ යාම යි.
(2) ගොවිතැන් කටයුතුවලට වඩා කම්හල්වල අවි නිෂ්පාදන වැඩි වීම යි.
(3) කම්කරුවන්, ගොවීන් සමග සොල්දාදුවන් ද විප්ලවයට එකතු වීම යි.
(4) සන්නද්ධ භට කණ්ඩායම් රජයේ ප්‍රධාන මධ්‍යස්ථාන අල්ලා ගැනීම යි.

**38.** A - ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරා ඝාතනය කිරීම
B - බිස්මාර්ක් ගේ විදේශ ප්‍රතිපත්තිය
C - හිට්ලර් ගේ ක්‍රියා කලාපය
D - ජපානයේ ක්‍රියා කලාපය
මෙම ප්‍රකාශ අතරෙන්, පළමුවන ලෝක සංග්‍රාමය සම්බන්ධයෙන්,
(1) A B සත්‍ය වන අතර, C D අසත්‍ය වේ. (2) A C සත්‍ය වන අතර, B C අසත්‍ය වේ.
(3) B C සත්‍ය වන අතර, A C අසත්‍ය වේ. (4) C D සත්‍ය වන අතර, A B අසත්‍ය වේ.

**39.** අමෙරිකා එක්සත් ජනපදය, දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වීමට බලපෑ ආසන්න ම හේතුව මින් කුමක් ද?
(1) ප්‍රංශය, ජර්මනියට විරුද්ධව යුධ ප්‍රකාශ කිරීම (2) හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීම
(3) ජපානය පර්ල් වරායට පහර දීම (4) ජර්මනිය රුසියාව ආක්‍රමණය කිරීම

**40.** වර්තමානයේ ද **අහිතකර** ප්‍රතිඵල අත්විඳින දෙවන ලෝක යුද්ධයේ බිහිසුණු ම ක්‍රියාවලිය වන්නේ,
(1) ජර්මනිය, ජපානය ඇතුළු අක්ෂ පක්ෂ පිලේ පරාජය යි.
(2) මිලියන පනහකට අධික වූ මිනිස් ජීවිත හා දේපල හානිය යි.
(3) ජර්මන් බල ප්‍රදේශවල යුදෙව්වන් මිලියන ගණනක් කඳවුරු තුළට ගාල්කර මරා දැමීම යි.
(4) ජපානයට විරුද්ධව පරමාණු බෝම්බ භාවිත කිරීම යි.

***

## අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

| ඉතිහාසය II | පැය තුනයි |
|---|---|

සැලකිය යුතුයි :

* I කොටසේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** **(අ)** පහත **(i)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ශ්‍රී ලංකා** සිතියමෙහි ද **(ii)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ලෝක** සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

**(i)** මල්වතු ඔය, මහනුවර, සූකරතිත්ථ, බුන්දල, නාච්චදූව වැව, මීගමුව, මඩකලපුව නගරය, යාපහුව, ගාල්ල, සේනානායක සමුද්‍රය, ත්‍රිකුණාමලය, මිනිපේ අමුණ (ලකුණු 12යි)

**(ii)** බොස්ටන් වරාය, පෘතුගාලය, සුභ පැතීමේ තුඩුව, ජාවා දූපත, පර්සියන් බොක්ක, හිරෝෂිමා (ලකුණු 06යි)

**(ආ) (i)** පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ ස්ථාන අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ක්‍රි.ව. 1344 දී යාපනයට පැමිණ ආර්ය චක්‍රවර්තීන්ගෙන් උදව් ලබා ගෙන, ශ්‍රී පාදය වන්දනා කළ අරාබි ජාතික සංචාරකයා

*B* - පෘථිවිය ගෝලාකාර බවත්, අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටේ පරිභ්‍රමණය වන බවත් සොයා ගත් විද්‍යාඥයා

*C* - මුස්ලිම් දරුවන් වෙනුවෙන් කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා

*D* - මහවැලි ගඟේ අතු ගංගාවක් කඩදොර නම් ස්ථානයේ දී හරස් කර නිර්මාණය කළ ජලාශය (ලකුණු 04යි)

* A හා B යටතේ දක්වා ඇති රූප අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

**(ii)** 1. A වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?
2. මෙම නිර්මාණය අයත් වන්නේ කුමන රාජධානි සමයකට ද?
3. මෙය අයත් ගෘහ නිර්මාණ සම්ප්‍රදාය කුමක් ද?
4. මෙම ගොඩනැගිල්ල නිර්මාණය කර ඇත්තේ කුමන ද්‍රව්‍යයකින් ද?



**A රූපය** (ලකුණු 04යි)

**(iii)** 1. B වලින් දැක්වෙන රූපය නම් කරන්න.
2. මෙය පිහිටා ඇත්තේ කවර රටක ද?
3. මෙම ගොඩනැගිල්ල ඉදි කළ රාජවංශය නම් කරන්න.
4. මෙහි අලංකාරයට යෙදූ නිර්මාණයක් සඳහන් කරන්න.



**B රූපය** (ලකුණු 04යි)

[2 වැනි පිටුව බලන්න

# II කොටස

**02.** **(i)** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ සාධක හමු වූ ලෙන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර ගැනීමට පදනම් වූ සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** පූර්ව ඓතිහාසික යුගයේ දියුණු තාක්ෂණයක් පැවැති බව කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු **දෙකක්** ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**03.** **(i)** ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ සෞඛ්‍යය පහසුකම් නගා සිටුවීම සඳහා කටයුතු කළ පාලකයන් **තිදෙනෙක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** ඓතිහාසික මූලාශ්‍ර අනුව මෙරට පැරණි සමාජයේ පැවති කර්මාන්ත වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

**(iii)** ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ දේශීය හා විදේශීය වෙළෙඳාම පැවැති බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** අන්‍ය සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් සමඟ සුහදශීලීව ජීවත් වීම මෙරට ඉතිහාසය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් බව උදාහරණ **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**04.** **(i)** පරිසරය සුරැකීම සඳහා නීති පනවන ලද ශ්‍රී ලංකාවේ රජවරු **තිදෙනෙක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** පහත සඳහන් කාර්යයන් සඳහා අය කළ බදු වර්ග අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - වැව්වල ජලය භාවිතා කිරීම
*B* - හේන් වගා කිරීම
*C* - රජුට අයත් ඉඩම්වල වගා කිරීම
*D* - ඇළ මාර්ගවලින් මත්ස්‍යයින් ඇල්ලීම (ලකුණු 04යි)

**(iii)** අතීතයේ දී ශ්‍රී ලාංකික කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමි ව තිබූ බව නිදසුන් **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම උදෙසා පැරණි දේශීය ආහාර පරිභෝජන රටාවෙන් ගත හැකි ආදර්ශ උදාහරණ **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**5.** **(i)** විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය බෙදී ගිය කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** ධර්මපාල රජුට මහජන සහය නොලැබීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** මහනුවර රාජධානි සමයෙහි පැවති ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රවල ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**06.** **(i)** පහත දැක්වෙන වගාවන් සඳහා පර්යේෂණායතන පිහිටි ස්ථාන අනුපිළිවෙළින් ලියා දක්වන්න.
*A* - තේ *B* - පොල් *C* - රබර් (ලකුණු 03යි)

**(ii)** කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික යෝජනා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** කෝපි වගාවේ දියුණුවට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** බ්‍රිතාන්‍ය පාලනය නිසා ඇති වූ හිතකර හා අහිතකර බලපෑම් **එක** බැගින් විස්තර කරන්න. (ලකුණු 06යි)

**07.** **(i)** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් අධිකරණ ආයතන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

**(ii)** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සමාජ සුභ සාධනය උදෙසා වැඩි අවධානයක් යොමු කර ඇති බව කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** නිදහස ලැබීමෙන් පසු කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

## III කොටස

**08.** 17 වන සියවසේ දී කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වී ව්‍යාප්ත විය.

**(i)** බ්‍රිතාන්‍යයට අමතර ව කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** කාර්මික විප්ලවය, සමාජ ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ''කාර්මික විප්ලවය නොනවතින ක්‍රියාවලියකි''. සන්නිවේදන හා ප්‍රවාහන ක්ෂේත්‍ර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**09.** **(i)** පළමුවන ලෝක සංග්‍රාමය අවසානයේ සාම ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා පවත්වන ලද සාකච්ඡාවලට නියෝජිතයන් සම්බන්ධ වූ රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)


**(iii)** ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** දෙවන ලෝක යුද්ධයෙන් පසුව බිහි වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය සුරැකීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

***

## අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

**1.** (අ) (i)



අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

**1.** (ඇ) (ii)

